# පුරාවිද්‍යා දිනයේ අරුත



සී. පී. බෙල් මහතා



මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා


## සිරිසමන් විජේතුංග

පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ පුරා විද්‍යා සහකාර අධ්‍යක්ෂ


පුරාවිද්‍යා දිනය යෙදී ඇත්තේ මේ මස 7 වැනිදට ය. පුරාවිද්‍යා දිනය ලෙසින් ජූලි මස හත්වැනිද යොදා ගෙන ඇත්තේ කුමක් නිසාදැයි කෙනෙකුගේ සිතට නැගිය හැකි ප්‍රශ්නයකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ 1890 ජූලි මස 7 වැනිදය. මේ නිසා පුරාවිද්‍යා දිනය එම දිනයට යොදා ගෙන ඇත. ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව රාජ්‍ය ආයතනයක් ලෙසින් ප්‍රතිෂ්ඨාපනය කර මේ වසරේ ජූලි මස හත් වැනිදට අවුරුදු එකසිය දෙළහක් (112) සපිරේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් අද ව්‍යවහාර කරන නාමය DEPARTMENT OF ARCHAELOGY ඩිපාට්මන්ට් ඔෆ් ආකියොලොජි යන නාමයයි. එහෙත් එදා එනම් 1890 ජූලි මස 7 වැනිද ඇරඹි මෙම දෙපාර්තමේන්තුව හැඳින්වූයේ ආකියොලොජිකල් සර්වේ ඔෆ් සිලෝන් ARCHAELOGICAL SURVEY OF CEYLON යන නාමයෙනි.

1889 වර්ෂයේ නොවැම්බර් මස 20 වැනිද එවකට ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ සර් ඒ.එච්. ගෝඩන් මහතා විසින් එකල රාජ්‍ය මන්ත්‍රණ සභාවට මෙසේ ලියා දන්වූයේ ය.

සීගිරියේ ඇති මතහර නෂ්ඨාවශේෂ පිළිබඳව ක්‍රමානුකූල පිරික්සා බැලීමක් කිරීමට අදහස් කර ඇත. එමෙන්ම ශීඝ්‍රයෙන් අතුරුදන්ව් ගෙන යන අතීත ස්මාරකයන් වැනසී යෑමට කලින් ඉන්දියාවේ කරගෙන යනු ලබන පුරාවිද්‍යා සමීක්ෂණයට සමාන සොයා බැලීමක් සුළු ප්‍රමාණයෙන් ආරම්භ කිරීමට (ඉන්දියාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට) කිරීමට අදහස් කොට ඇත.

ඉන්දියාවේ පුරාවස්තු හැඳෑරීම සඳහා ක්‍රමානුකූල වැඩපිළිවෙලක් ආරම්භ කරන ලද්දේ 1861 වර්ෂයේ දී ය. එම වර්ෂයේ දී පුරාවස්තු පිළිබඳව දිගුකලක සිට උනන්දුවක් දැක්වූ ඇලෙක්සැන්ඩර් කනිංහැම් මහතා එහි ප්‍රධානියා වශයෙන් පත් කරන ලදී.

ඉන්දියාවේ පුරාවිද්‍යා කටයුතු සඳහා බ්‍රිතාන්‍ය රජය විසින් ආරම්භ කළ එම කාර්යයට වසර විසි තමයකට පසුව ලංකාවේ පුරාවිද්‍යා කටයුතු පිළිබඳ රාජ්‍ය දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සැබැවින්ම බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් අප රටේ උරුමය සුරැකීම වෙනුවෙන් තබන ලද ඉතා විශිෂ්ඨතම පියවරක් ලෙසින් සඳහන් කළ යුතුව ඇත.

1890 ජූලි මස 7 වැනිද පිහිටුවන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වූයේ ද ඉංග්‍රීසි ජාතිකයෙකි. ඔහු ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වරයා ය. එච්.සී.පී. බෙල් මහතා ඒ වන විට කෑගල්ල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් විනිශ්චයකාරයා ලෙසින් සේවය කළේ ය. ලංකා සිවිල් සේවයට අයත්ව සිටි බෙල් මහතා පෙරදිග මෙන්ම අපරදිග සංස්කෘතිය පිළිබඳව ද පූර්ණ දැනුමක් තිබූ විද්වතෙකු ද වූයේ ය. ඒ බව ඔහු විසින් ලියන ලද පුරාවිද්‍යා පාලන වාර්තා මෙන්ම කෑගලු වාර්තාව අනුවද පැහැදිලි වනු ඇත. එච්.සී.පී. බෙල් මහතා 1890 සිට 1912 දක්වා පුරාවිද්‍යා කොමසාරිස් තනතුර හෙබවූයේ ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආරම්භක රාජකාරී පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය ග්‍රන්ථයෙහි සඳහන් වන්නේ මෙසේ ය.

ආණ්ඩුකාර සර් ජේ.එම්. ගෝඩන්ගේ නියමය පරිදි උතුරුමැද පළාත් පුරාවිද්‍යා සමීක්ෂණය ආරම්භ කිරීම පිණිස 1890 ජූලි මස 7 වනද එච්.සී.පී. බෙල් මහතා අනුරාධපුරයට ගියේ ය.

ආණ්ඩුවේ අයවැයෙන් 1890 වර්ෂය සඳහා පුරාවිද්‍යා කටයුතු වෙනුවෙන් වෙන් කර තිබූ මුදල



පොළොන්නරුව ගල් විහාරයේ හිඳි බුදු පිළිමය - ක්‍රි. ව. 12 වැනි සියවස



**කුරුණෑගල රිදී විහාරයේ ඇත් දළ කැටයමක්**
**- ක්‍රි. ව. 18 සියවස**

රු. 10,000 කි. මුලදී පුරාවිද්‍යා කොමසාරිස් විසින් සේවයේ යොදවන ලද්දේ සිංහල හා දෙමළ කම්කරුවන් විසි දෙනෙකු පමණකි. පසුව කම්කරු සංඛ්‍යාව තිහ දක්වා වැඩි කරන ලදී. ඔහු නිත්‍ය ලිපිකරුවකු හා පරිවර්තකයෙකු නොසිටි බැවින් කාර්යාල වේලාවෙන් බාහිරව වැඩ කිරීම සඳහා කච්චේරියේ ලිපිකරුවකු සැපයීමෙන් ආණ්ඩුවේ ඒජන්ත තැන ඔහුට උපකාරී විය. ශිලා ලේඛන පිළිබඳ වැඩ කටයුතු සඳහා කොළඹ කෞතුකාගාරයේ සහකාර පුස්තකාලයාධිපති ඩී.එම්. ඉසෙඩ් වික්‍රමසිංහ මහතා පුරාවිද්‍යා කොමසාරිස් යටතේ වැඩ කිරීම සඳහා අනුයුක්ත කරන ලදී.

පළමු පියවරක් වශයෙන් නිශ්චිත සීමාවන් (නිදසුනක් වශයෙන් ඇතුළු හා පිටත රවුම් පාරවල්) ඇතුළත කැලෑව මුළුමනින් හා ක්‍රමානුකූලව සොයා බැලීම සඳහා අනුරාධපුරයේ සිටි සුළු කම්කරු පිරිස යෙදවීමට බෙල් මහතා තීරණය කළේ ය. මෙහි අරමුණ වූයේ පොළව මතුපිට තවමත් ශේෂ වී තිබුණු නටබුන් මොනවැදැයි දැන ගැනීම යි. එසේ කිරීමෙන් මෙතෙක් පිළිවෙලක් නැතිව එහෙත් මෙහෙත් දරා ඇති ප්‍රයත්නතවලදී වඩා අඩු කාලයකින් අඩුවියදමකින් හා අඩු ශ්‍රමයකින් අවශ්‍ය භූමි භාගය කැණීම කළ හැකි විය. එබඳු ක්‍රමානුකූල ගවේෂණය ඉක්මන් නොවූවත් නිතර සිදුවන විශ්මිත සොයා ගැනීම්වලින් තොර වුවත් ලංකාවේ ආණ්ඩුව අදහස් කළ "අනුරාධපුරය සම්පූර්ණයෙන්ම කැණීමේ හා සමීක්ෂණය කිරීමේ" කාර්යය සතුටුදායක ලෙස නිම කිරීමේ එකම නිසැක ක්‍රමය විය. වැඩ කිරීමේ පහසුකම සඳහා නූතන අනුරාධපුර නගරය සහ ඒ අවට ප්‍රදේශය A, B, C, D, E, F, G, X, Y යනුවෙන් ප්‍රදේශ ගණනාවකට බෙදා ලකුණු කරන ලදී. (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය - පි. 7 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි. 1990)

එච්.සී.පී. බෙල් මහතාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුරයට අමතරව සීගිරිය, පොළොන්නරුව හා රිටිගල මෙන්ම තවත් පැරණි ස්ථාන ගවේෂණය කර පුරාවස්තු මතු කර ගැනීමේ කටයුතු සිදු කළා පමණක් නොව එම කාර්යයන් සියල්ලක්ම වාර්තා ගත කළේ ය. එම වාර්තා වාර්ෂික පාලන වාර්තා වශයෙන් ප්‍රකාශයට පත් කළේ ය. මේ නිසා අදත් අපට ඔහු විසින් පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ සිදු කළ කාර්යයන් ගැන නිසි අවබෝධයක් ලබාගත හැකිව ඇත. බෙල් මහතාගේ මෙම කණ්ඩායම සාමාන්‍ය ජනතාව විසින් හඳුන්වන ලද්දේ 'බෙල් පාටිය' යන නාමයෙනි. මෙම බෙල්පාටියට මුල්ම පුරාවිද්‍යා සේවක පිරිස අයත් වූයේ ය.

විශේෂයෙන්ම සීගිරිය පිළිබඳව සඳහන් කරන විට එච්.සී.පී. බෙල් මහතා කිසිසේත් ම අමතක කළ හැකි නාමයක් නොවේ. බෙල් මහතාගෙන් සීගිරියට සිදු වූ සේවාව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා අගය කරන්නේ මෙසේ ය.

මේ දෙපාර්තමේන්තුවේ ඉරණම මෙහෙයවනු වස් සිවිල් සේවයෙන් තෝරා ගන්නා ලද එච්.සී.පී. බෙල් මහතා පටන් ගත් මුල්ම කටයුතු වලින් එකක් වූයේ සීගිරියේ ඓතිහාසික නෂ්ඨාවශේෂ සමීක්ෂණය කිරීම, එළිපෙහෙළි කිරීම, කැනීම හා සංරක්ෂණය කිරීම යි. 1894 දී වනගත දුවයෙන් සැදූ ඉණිමගක් පිහිට කොට ගත් බෙල් මහතා පව්ව මුදුනට නැග වෘක්ෂයෙන් හා ඝණ කැලෑවෙන් වැසුණු පෙදෙස කැනීමෙන් එළිමහනට ගෙන ආ යුතු වැදගත් ගොඩනැගිලි නටබුන් ඇති බව දුටුවේ ය.

(සීගිරි කුරුටු ගී - මහාචාර්ය සෙනරත් පරණවිතාන සිංහල පරිවර්තනය - 2000 මහාචාර්ය සුචරිත ගම්ලත් පි. 3)

එච්.සී.පී. බෙල් මහතාට (1890-1912) පසුව පුරාවිද්‍යා කොමසාරිස් ධූරයට පත්වූයේ ආර්. අයර්ටන් මහතා ය. බී. කොන්ස්ටන්ටයින්, එච්.ආර්. ප්‍රීමන්, ඒ.ඇම් හොකාට්, ඒ.එච්.ලොං හර්ට්ස් ආදී විදේශික විද්වතුන් කීප දෙනෙකුම මෙම පුරාවිද්‍යා කොමසාරිස් තනතුරු හෙබවූ අතර ඒ.එච්. ලොංහර්ට්ස් මහතා 1934 සිට 1940 දක්වා පුරාවිද්‍යා කොමසාරිස් ධූරයේ සේවය කළ විදේශික විද්වතාණන්ට පසුව 1940 දී ශ්‍රී ලාංකිකයෙක් ප්‍රථම වතාවට පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත්වූයේ ය. එතුමා නම් ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා ය. එතුමා 1923 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බැඳුණේ ඒ වන විට දැනට ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති උඩුගම්පල විද්‍යාලයේ ඉංග්‍රීසි උප ගුරුවරයෙකුව සිටියදී ය. (දැන් මෙම විදුහල මහාචාර්ය සෙනරත් පරණවිතාන අනුස්මරණ මහා විද්‍යාලය නමින් නම් කර ඇත) 1940 සිට 1956 දක්වා කාලය තුළ පුරාවිද්‍යා කොමසාරිස් වශයෙන් වසර 16 තුළ එතුමා කළ සේවාව මේ රටේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට පමණක් නොව ඉතිහාසය හා සාහිත්‍යය හා භාෂාව



**පොළොන්නරුවේ හමු වූ ලෝකඩ ගණ දෙවි රුවක්**
**- ක්‍රි. ව. 12 සියවස**

ආදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ද පැතිරී ගියේ ය. ඉත්පසුව පහත සඳහන් විද්වතුන් මෙම තනතුරෙහි වැඩ බැලූ බැව් වාර්තාගත වී ඇත. ඒ මෙසේ ය.

1. සහකාර කොමසාරිස් (ශිලා ලේඛන) සද්ධාමංගල කරුණාරත්න මහතා 1956-9-25 සිට 1957-1-24 දක්වා (පසුව ඔහු පුරාවිද්‍යා කොමසාරිස් ධූරයට ද පත් විය)

2. සිවිල් නිලධාරී ජේ.එච්. ලැනරෝල් මහතා (1957-1-24 සිට 1957-2- 21 දක්වා)

3. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ පී.ඊ.පී. දැරනියගල මහතා 1957-2-12 සිට 1958-5-1 දක්වා

4. මහාචාර්ය පී.සී. සෙස්තියරි මහතා 1958-5-1 සිට 1959-2-17 දක්වා

(1959 පුරාවිද්‍යා පාලන වාර්තාව - ආචාර්ය චාල්ස් ගොඩකුඹුර පි. 7)

ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා 1960 සිට පුරාවිද්‍යා කොමසාරිස් තනතුර 1967 දක්වා හෙබවූයේ ය.

ඉත් පසුව මේ දක්වා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් පිළිබඳව සඳහන් කරන විට මෙහිදී විශේෂ කරුණක් සඳහන් කළ යුතුව ඇත. එනම් 1990 වර්ෂයේ සිට පුරාවිද්‍යා කොමසාරිස් යන නාමය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් භාවිත කිරීම ය. ඊට හේතුව 1990 වර්ෂය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවා වසර සියයක් සපිරීම වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම නිසා ය. ඒ අනුව ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතාට පසුව සේවය කළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මෙසේ ය.

**පුරාවිද්‍යා කොමසාරිස්වරු**

ආචාර්ය රාජා ද සිල්වා මහතා (1967-1979)

ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න මහතා (1979-1983)

ආචාර්ය රොලන්ඩ් සිල්වා මහතා (1983-1990)

**පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරු**

ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා (1990-1991)

ඇම්.එච්. සිරිසෝම මහතා (1991-1992)

ආචාර්ය සිරාන් දැරනියගල මහතා (1993-2001)

ආචාර්ය ඩබ්.එම්. විජයපාල මහතා (2002 සිට)



**අනුරාධපුර ඉසුරුමුණියේ පෙම් යුවළ**
**- ක්‍රි. ව. 7- 8 සියවස්**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ලංකාවේ ඇති සියළුම පුරාවස්තු හා පුරාවිද්‍යා ස්ථාන සුරැකීමේ වගකීම 1940 අංක 9 දරන පුරාවිද්‍යා ආඥාපනත මගින් පැවරී ඇත. මේ නිසා එම දෙපාර්තමේන්තුව සතු බලතල කිසිදු ආයතනයකට හෝ පුද්ගලයෙකුට පවරා දී නැත.


මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පාලනය වන සංස්කෘතික ත්‍රිකෝණය විසින් වුවද කැණීම් කටයුතු කිරීම පිණිස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වරයාගෙන් ලිඛිත අවසරයක් ලබා ගත යුතු වන්නේය. පුරාවස්තු යනු පුද්ගලයෙකුගේ හැඳුනුම්පතක් හා සමාන ය.

ඒ හැඳුනුම්පත පිළිබඳ අවබෝධයක් ලබාදීමට සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් සිදු කළයුතු මෙහෙවර නම් මේ රටේ ඇති පුරාවස්තු හා බද්ධ වූ අපගේ පැරණි ජාතික ඉතිහාසය අප රටේ ජනතාවට අවබෝධකර දීමේ වැඩපිළිවෙලක් දියත් කිරීම යි.

මේ කාර්යය යථා යෝග්‍ය අන්දමින් අප නිදහස ලබා ගත වූ වසර පණහක කාලය තුළ දී සිදුවී ඇත්දැයි යළි සිංහාවලෝකනය කිරීමට මේ සුදුසුතම කාලය යි.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ අප රටේ පැරණි ජන උරුමය පිළිබඳ අවබෝධයක් ලබා දීම සඳහා විශේෂිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සිංහල - මුස්ලිම් හා දෙමළ යනු ජනතාව අතර අන්‍යොන්‍ය අවබෝධය වැඩිවීමට විනා ඔවුනොවුන් අතර සබඳතාවය දුරස්වීමට කිසිසේත්ම හේතු නොවනු ඇත. අප රටේ ජාතික ඉතිහාසය හැදෑරීම පාසල් අධ්‍යාපනය තුළ පමණක් නොව විශ්ව විද්‍යාල අධ්‍යාපනය තුළද අනිවාර්ය කළ යුතුව ඇත. එවිට අප රටේ දැනට ඉතිරි වී ඇති පුරාවස්තු ස්වල්පයවත් රැක ගැනීමට හැකි වනු ඇත. පුරාවිද්‍යා දිනයක් ලෙසින් 1991 වර්ෂයේ දී එවක පැවති රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද්දේ මෙහි ඇති ජාතික වැදගත්කම සළකා ගෙන ය. ඒ වර්ෂයේ සිට මෙම පුරාවිද්‍යා දිනය වර්ෂයක් පාසා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් පැවැත් වේ.

සැබැවින්ම මෙහි ජාතික වැදගත්කම කෙරෙහි තවමත් නිසි අවධානයක් යොමු වී නැති බව



**අනුරාධපුර සඳකඩ පහන**
**- ක්‍රි. ව. 8 සියවස**

පුරාවස්තු යනු පුද්ගලයෙකුගේ හැඳුනුම්පතක් හා සමාන ය. ඒ හැඳුනුම්පත පිළිබඳ අවබෝධයක් ලබාදීමට සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් සිදු කළයුතු මෙහෙවර නම් මේ රටේ ඇති පුරාවස්තු හා බද්ධ වූ අපගේ පැරණි ජාතික ඉතිහාසය අප රටේ ජනතාවට අවබෝධකර දීමේ වැඩපිළිවෙලක් දියත් කිරීම යි.

අකමැත්තෙන් වුවද ප්‍රකාශ කළ යුතුව ඇත. පුරාවස්තු රැක ගැනීමේ කාර්යය රාජ්‍ය ආයතනයකට හෝ දෙකකට පමණක් තනිව කළ හැකි කාර්යයක් නොවේ. ඒ සඳහා සෑම පුරවැසියකුගේම වගකීම මෙහිදී අවධාරණය කළ යුතුව ඇත.

විවෘත ආර්ථික ක්‍රමය හමුවේ වියරු වැටී මුදල් පසුපස හඹා යන පාරිභෝගිකයා ද සමාජයක් තුළ මිල මුදලට හුවමාරු වන භාණ්ඩ අතරට පුරාවස්තු ද යොමු වී තිබීම ජාතියේ අවාසනාවකි. නීති-රීති පනවා දඬුවම් වැඩි කර පුරාවස්තු විනාශ කරන්නන්ට පුරාවස්තු සොරුන්ට හා ඒවා විකුණන්නන්ට එරෙහිව ක්‍රියා කළ යුතු බව සැබෑ ය. එසේ වුවද ඒ සමගම අප රටේ ඇති මේ පුරාවස්තුවල ඇති වටිනාකම හා අගය යළි ඒවා නිර්මාණය කළ නොහැකි බව අප විසින් අවබෝධ කර ගත යුතු ය.

මේ කරුණු අපේ ළමා පරපුරට අවබෝධ කරවීමේ ජාතික වැඩපිළිවෙලක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් ක්‍රියාත්මක කළ යුතු වන අතර ඒ සඳහා සකල ජනමාධ්‍ය ආයතනවලටද වගකීමක් ඇති බව අමතක කළ යුතු නොවේ.

අද ක්‍රිකට් හා හින්දි චිත්‍රපට වලට ජනමාධ්‍ය ආයතනවල ඇති අවධානය පිළිබඳ දෝෂාරෝපණය නොකරන නමුදු අප රටේ අතීත ජන උරුමය පිළිබඳ පහද දීමට මෙම ජනමාධ්‍ය ආයතන මැලිවන්නේ කුමක් නිසාදැයි අපි නොදනිමු.

අද පුරාවස්තු කොල්ල කෑම විනාශ කිරීම සඳහා චීවරධාරීන් ද ඇතැම් ආරක්ෂක අංශයේ පුද්ගලයන් ද යොමු වී තිබෙනු පසුගිය කාලයේ පුවත්පත් වාර්තා වලින් ද පැහැදිලි විය. මේ තත්ත්වය ඉතා කනගාටුදයක ය.

පාරිභෝගිකවාදය තුළ සිර වී සිටින ජනතාවට ඔවුන්ගේ ගේ දොර පවා විකුණාගෙන කෑමට තරම් සිත්වන දිනයක් අනාගතයේදී උදා නොවන්නේදැයි කාට කිව හැකි ද.

අප රටේ ජාතික උරුමය ලෙසින් අද පවතින මේ පුරා වස්තු හා පුරාවිද්‍යා ස්ථාන බුදු දහම හා අපයෝජනය ලෙස බැඳී අපේ අතීත මුතුන්මිත්තෝ පණ සේ රැකගෙන අප වෙත භාර දුන්හ.

අපට පෙර සිටි අපගේ ඒ මුතුන්මිත්තන්ට ඒවා විකුණාගෙන කෑමට හෝ විනාශ කිරීමට ඕනෑ තරම් අවස්ථා තිබුණි. එහෙත් වසර දෙදහස් ගණනක් තිස්සේ අප රටේ සම්ප්‍රදය වූයේ ඒ සියල්ල මතු පරපුර සඳහා රැක ගැනීමයි. එසේ රැක නොගත්තේ නම් අද අපට ජීවමානව අනුරාධපුරයේ මහමෙවුනා උයනේ යහනින් වැඩ සිටින ශ්‍රී මහා බෝධීන් වහන්සේ දැක ගැනීමට ලැබේද. එද පස්මරුන් පරදා මාර විජයෙන් පසුව සම්මා සම්බෝධියට පත් වීමට ඒ සිදුහත් කුමරුන්ට සෙවන දුන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අද දඹදිව බුද්ධගයාවේ නැත. ඒ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මීට වසර 2310 පෙර ලංකාවට වැඩම කළේ නැත්නම් සඳහට ම එම ශ්‍රී මහා බෝධීන් වහන්සේ දැක ගැනීමට නොලැබෙනු ඇත. ඒ ජීවමාන වෘක්ෂ රාජයාණන්වහන්සේ වසර 2310 ක් තිස්සේ ආරක්ෂා කළ මේ අපගේ මුතුන්මිත්තන්ගෙන් පැවත එන අපට ගලින් ගඩොලින් මැටියෙන් හුනු බදාමයෙන් නිම කරන ලද පුරාවස්තු මහා කාරියක් නොවේයැයි කෙනෙකුට සිතෙනු ඇත. එය සත්‍යයකි. එද අපේ ඒ මුතුන්මිත්තන් ඒවා රැකගත්තේ එද පන්සලේදීත් බණ මඩුවේදීත් අපේ ඒ පුරාවස්තු පිළිබඳ නිසි අවබෝධයක් අපට ලබා දීමට ලබා ගැනීමට අවස්ථා සැලසුණු නිසා ය. එම නිසා මාධ්‍ය ආයතනවල වගකීම වන්නේ ඒ අපේ අතීත ජන උරුමය පිළිබඳ ජනතාවට නිසි අවබෝධයක් ලබා දීමයි.

අද බොහෝ ජනමාධ්‍ය ඔස්සේ පුරාවස්තු සොරකම් හා ඒවා විනාශ කිරීම පිළිබඳ වාර්තා කිරීමේදී "දඹරන් පිළිම" "මිල කළ නොහැකි පිළිම" නිදන් වස්තු ආදී කිසිදු තේරුමක් නැති වචන යොදා ඒ සඳහා නැති අගයක් මවා පෑමට උත්සාහ කරනු දැකිය හැකිය. කිසිදු පිළිමයක් දඹරන් වලින් නිම කළ නොහැකි ය. පිළිම නිර්මාණය සඳහා රත්රන් වලට වෙනත් ලෝහ මිශ්‍ර කළ යුතු ය. මේ නිසා දඹරන් පිළිම යන වචනය තේරුමක් නැති වචනයකි.

තවද මිල කළ නොහැකි යන වචනය ද නිතර නිතර මාධ්‍යයන් වලින් භාවිත වන වචනයකි. සත්‍ය වශයෙන්ම පුරාවස්තුවක අගය මිල කළ නොහැකි බව සත්‍යයකි. එහෙත් බොහෝවිට ජනමාධ්‍යවලින් මතු කර දක්වන්නට උත්සාහ කරන්නේ එහි වෙළඳ මිල ය. නනිකර රත්රන් වලින් හෝ දඹරන් වලින් කිසිදු ආභරණයක් සෑදීම කළ නොහැකි සේම බුදුපිළිම ද සෑදීම කළ නොහැකි ය. එනිසා දඹරන් බුදු පිළිම යන කතාව ජනමාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමෙන් සිදු වන්නේ මෙවැනි සොරකම් සඳහා තව තවත් පුද්ගලයින් පෙළඹවීමක් නොවන්නේ ද?.


ජනමාධ්‍ය වලින් සිදු කෙරෙන තවත් වරදක් නම් පුරාවස්තු හෝ ශිලා ලිපි බුදු පිළිම වැනි මූර්ති හමු වූ විට ඒ පිළිබඳව වාර්තාකරණයේ දී පමණක් නොව සමහර විශේෂාංග ලිපි වලදී පවා බොහෝවිට සත්‍යය නොව ව්‍යාජ තොරතුරු ලිවීම යි. උදාහරණයක් ලෙසින් මෑතක දී සතිඅන්ත පුවත්පතක අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිම හඳුන්වාදීම සඳහා යොදා තිබුණේ ඒවා බුදුපිළිම ලෙසිනි. බ්‍රාහ්මී අක්ෂර යන්න වෙනුවට ඒවා නාගර අක්ෂර යැයි ද එහි සඳහන් කර තිබුණි.

පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ විශේෂාංග ලියන ඇතැම් ලේඛකයින් වලගම්බා රාජ යුගය ගැන නිතරම සඳහන් කරන්නේ විශේෂයෙන්ම පැරණි ලෙන් පිළිබඳ ලිවීමේ දී ය.

මෑතකදී මෙසේ සඳහන් කරමින් වලගම්බා රජතුමාගේ කාලයේ බුදු පිළිමයක් ගැන ලියා තිබුණි. ලංකාවේ තබා භාරතයේ ද වලගම්බා රාජ යුගයේ දී බුදුපිළිම නිර්මාණය වී තිබුණේ නැත. බුදු පිළිම භාරතයේ නිර්මාණය වූයේ ක්‍රිස්තු වර්ෂ දෙවැනි සියවසේදී කණිෂ්ක රාජ යුගයේදී ය.

ගන්ධාරයේ ගන්ධාර බුදුපිළිම කලාවත් මථුරාහි මථුරා බුදුපිළිම කලාවත් එම යුගයේ දී ආරම්භ වූයේ ය. මෙවැනි කරුණු පිළිබඳ ලිවීමේදී පොත්-පත් පරිහරණයෙන්වත් කිසියම් අවබෝධයක් ලබාගෙන එම කාරිය කරන්නේ නම් පාඨක ජනතාව නොමග යැමෙන් වලකින බව පෙන්වා දිය යුතුව ඇත.

මෙහිදී ද මතු වී පෙනෙන්නේ පාසල් අධ්‍යාපනය තුළදී ඔවුන්ට ඒ පිළිබඳ දැනුමක් ලබා ගැනීමට අවස්ථාව නොමැති නිසාම මෙසේ සිදුවන බවය. එහෙත් ඊට සමාව දිය හැකි නොවේ. ❑



**මැදිරිගිරිය වටදාගෙය**
**- ක්‍රි. ව. 7-8 සියවස්**

නීති-රීති පනවා දඬුවම් වැඩි කර පුරාවස්තු විනාශ කරන්නන්ට පුරාවස්තු සොරුන්ට හා ඒවා විකුණන්නන්ට එරෙහිව ක්‍රියා කළ යුතු බව සැබෑ ය. එසේ වුවද ඒ සමගම අප රටේ ඇති මේ පුරාවස්තුවල ඇති වටිනාකම හා අගය යළි ඒවා නිර්මාණය කළ නොහැකි බව අප විසින් අවබෝධ කර ගත යුතු ය.